තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**ආර්. එස්. හෙට්ටිආරච්චි එ. කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාලය**

RTIC Appeal (දෙපාර්ශවය ඉදිරියේ විභාග කිරීම)/ 666/2021 (2021.12.20 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න
**කොමිෂන් සභා සාමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික:** විශ්‍රාමික විනිසුරු විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ආර්. එස්. හෙට්ටිආරච්චි
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාලය

**පෙනීසිටීම**

**අභියාචක** - පෙනී නොසිටී
**නොතිසි ලත් පාර්ශවය** - ජේ.කේ.ජයනන්ද, සහකාර කොමසාරිස්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2020.07.20 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2020.08.16 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2021.02.02 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් 2020.07.20 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*1 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණයක් 2015 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*
*ii - එම කුඹුරු ඉඩම් තුල 2015 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2015 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*2 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණයක් 2016 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*
*ii - එම කුඹුරු ඉඩම් තුල 2016 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2016 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*3 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණය 2017 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*

*ii - එම කුඹුරු ඉඩම් තුල 2017 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2017 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*4 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණය 2018 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*
*ii - එම කුඹුරු ඉඩම් තුල 2018 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2018 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*5 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණයක් 2019 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*
*ii - එම කුඹුරු ඉඩම් තුල 2019 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2019 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*6 - i - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් කොපමණ අක්කර ප්‍රමාණයක් 2020 වර්ෂයේ දී වාර්තා වී තිබේද?*
*ii - එම කුඹුරු ඉඩම් තුල 2019 වර්ෂයේ වී වගා කර ඇති අක්කර ප්‍රමාණය කොපමණද?*
*iii - ඉන් 2019 වර්ෂයේ කොපමණ වී අස්වැන්නක් ලබාගෙන තිබේද?*

*7 - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් යම් අයුරකින් කුඹුරු ඉඩම් ප්‍රමාණයේ අඩු වීමක් ඇත්නම් ඒ සඳහා බලපා ඇති හේතු මොනවාද?*

*8 - යම් අයුරකින් වී වගා කර ඇති අක්කර ප්‍රමාණය අඩු වීමක් ඇත්නම් ඒ සඳහා බලපා ඇති හේතු මොනවාද?*

*9 - කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් තුල වෙනත් බෝග වගා කිරීම සඳහා අක්කර කොපමණ ප්‍රමාණයක් සඳහා මේ වනවිට අවසර ලබා දී තිබේද?*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.08.16 දිනැතිව නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම් කළ නිලධාරියාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇති බැවින් 2021.02.02 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ තොරතුරු ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට තොරතුරු නිලධාරියා හා නම්කල නිලධාරියා කටයුතු කර නොමැති බවයි.

තවද පොදු අධිකාරිය විසින් අද දින මෙම අභියාචනයට අදාළ තොරතුරු කොමිෂන් සභාව වෙත ලබා දෙන ලද අතර එහි පිටපතක් අභියාචක වෙත යවා ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී.

**නියෝගය:**

තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) වගන්තියේ සඳහන් පරිදි "ඉල්ලීමක් ලැබීමේදී එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයෙකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතුය" යන්න හ 25 (1) වගන්තියේ සඳහන් පරිදි "තොරතුරු නිලධරයෙකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වුවද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලබී දින 14 ක් ඇතුළත...... ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර එම තීරණය ඉල්ලීම කල පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතුය" යන සිය ව්‍යවස්ථාපිත වගකීම සිදුකර නොමැති බවයි.

එසේම නම්කළ නිලධාරියාද පනතේ 31(2) වගන්තිය අනුව එනම් " නම්කළ නිලධරයා විසින් ඕනෑම අවස්ථාවකදී එසේ වූවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී කුවිතාන්සියක් නිකුත් කළ යුතුය" හා 31(3) වගන්තියේ සඳහන් පරිදි "නම්කළ නිලධාරියා විසින් (1) වන උප වගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර ඒ සඳහා නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු දැක්විය යුතුය" යන සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බව නිරීක්ෂණය කර සිටී. ඉහත සඳහන් තත්වයන් යටතේ, ඉදිරියේදී තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමේදී පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත කාල නියමයන් අනුගමනය කරන ලෙසට පොදු අධිකාරියට නියම කරනු ලැබේ.

පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද 2021.12.17 දිනැති ලිපිය අනුව පොදු අධිකාරිය සන්තකයේ භාරයේ හෝ පාලනයේ ඇති මෙම තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු අභියාචකට ලබා දී ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ. අදාළ ලිපියේ පිටපතක් නියෝගය සමග අභියාචක වෙත අමුණා යවනු ලැබේ.

තවද, ලබා දී ඇති තොරතුරු සම්බන්ධයෙන් අභියාචක සෑහීමකට පත් නොවන්නේ නම් මෙම නියෝගය ලැබී මසක් ඇතුලත ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දන්වා එවන ලෙස අභියාචක වෙත නියෝග කරනු ලැබේ.

ඒ අනුව තොරතුරු පනතෙහි 3 වන වගන්තියෙහි ඇති අවශ්‍යතා සපුරාලන බැවින් අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.